ඉදිරි කටයුතු සඳහා ලබා දෙන්න.


පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண சமூக சேவைகள் திணைக்களம் - வடமத்திய மாகாணம்
POVINCIAL DEPARTMENT OF SOCIAL SERVICES – NORTH CENTRAL PROVINCE

372, ධර්මපාල මාවත, අනුරාධපුර. இல 372,தர்மபால மாவத்தை, அநுராதபுரம் NO. 372, Dharmapala Mawatha, Anuradhapura

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ பணிப்பாளர் Director | 025 - 2234673 | කාර්යාලය அலுவலகம் Office | 025 - 2224173 | ෆැක්ස් பெக்ஸ Fax | 025 - 2224173 |
| මගේ අංකය எனது இலக்கம் My No. | NCP/SS/E1/20 | ඔබේ අංකය உமது இலக்கம் Your No. | | දිනය திகதி Date | 2015/11/11 |


<u>පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 11/2015</u>

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ
සියළුම සංවර්ධන සහකාර නිලධාරීන්/ සංවර්ධන නිලධාරීන් වෙත,

<u>පූර්ණ ආබාධ මාසික ආධාර මුදල සංශෝධනය</u>

පවුලේ සාමාජිකයෙකු පූර්ණ ආබාධිත තත්වයක පසුවීම හේතුවෙන් එම පුද්ගලයා රැක බලා ගැනීම සඳහා පවුලේ වෙනත් සාමාජිකයෙකුට ඒ වෙනුවෙන්ම කැපවී සිටීමට සිදුවීම තුළ බිඳ වැටෙන පවුලේ ආර්ථික තත්වය සඳහා සහනයක් සැළසීමත්, පවුලේ ආර්ථික තත්වය බිඳ වැටීම තුළ ආබාධිත පුද්ගලයාට අවශ්‍ය නිසි රැකවරණය හා සෞඛ්‍ය පහසුකම් හා පෝෂණය ලබා දීමේ අපහසුතාවයට සහනයක් සැළසීමත් අරමුණින් අඩු ආදායම්ලාභී එකී පවුල් එකක සඳහා ක්‍රියාත්මක කරනු ලබන රු. 800.00ක පූර්ණාබාධ මාසික ආධාර මුදල රු. 2,000.00 ලෙස වැඩි කිරීමට තීරණය කර ඇත.

02. මේ වන විට ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පූර්ණාබාධ ආධාර ලබන්නන් සම්බන්ධයෙන් ඉතා කඩිනමින් පසුවිපරමක් සිදු කොට එම ආධාරලාභීන් පූර්ණාබාධ ගණයට අයත්වන්නේදැයි පරීක්ෂා කළ යුතුය. ඒ අනුව දැනට ආධාර ලබන ආධාර ලාභීන් සම්බන්ධයෙන් වන විස්තර මේ සමග අමුණා ඇති ආකෘතියෙන් මා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු අතර, එකී අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව නව සංශෝධිත ආධාර මුදල ගෙවීමට කටයුතු කළ යුතුය.

03. යම් හෙයකින් මේ වන විට රු. 800.00ක පූර්ණාබාධ මාසික ආධාර දීමනාව ලබන එහෙත් පූර්ණාබාධ ගණයට අයත් නොවන ආධාර ලාභීන් වේ නම්, සෙසු ආධාර ලාභීන් සඳහා සංශෝධිත ආධාර මුදල ගෙවන දින සිට ඔවුන් සඳහා විශේෂ මහජන ආධාර යටතේ ඔවුන් ඇතුලත් කර ආධාර මුදල රු. 1000.00ක් ලෙස සංශෝධනය කළ යුතුය.

04. උතුරු මැද පළාත් සභාවේ 2015/21 දරණ අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරන ලද අංක 2015/92 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

අජන්ත ගුණවර්ධන,
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ,
උතුරු මැද පළාත.

අජන්ත ගුණවර්ධන
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ
උතුරු මැද පළාත